# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 710 /2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 25/04/2024<br>පැය 1800 |

## මාධ්‍ය නිවේදනය

### ක්ෂණික විහිදුම් යතුරුපැදි බලකායේ විසිරයාමේ උත්සවය - කටුකුරුන්ද පොලිස් විශේෂ කාර්ය බලකා කඳවුර.

**සංවිධානාත්මක අපරාධ කණ්ඩායම් සහ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් මර්ධනය කිරීම සඳහා විශේෂ කාර්ය බලකායේ "SECURITY EYE" හෙවත් "ආරක්ෂක ඇස" නමින් ක්‍රියාත්මක අපරාධකරුවන් හඹා ගොස් අත්අඩංගුවට ගැනීම සඳහා විශේෂ පුහුණුවක් ලද පළමු පොලිස් යතුරුපැදි කණ්ඩායම** විසිරයාමේ පෙළපාලිය ගරු මහජන ආරක්ෂක අමාත්‍ය ටිරාන් අලස් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සහ පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාගේ සහභාගීත්වයෙන් 2024.04.25 වන අද දින උදෑසන කළුතර, කටුකුරුන්ද පොලිස් විශේෂ කාර්ය බලකා පුහුණු පාසලේදී පැවැත්විණි.

මෙහිදී පුහුණුව හදාරන ලද නිලධාරීන් වෙත සහතිකපත් සහ විශේෂ ලාංඡන පිරිනමන ලද අතර පුහුණුව ලබා නිලධාරීන් 100 දෙනෙකු විසිර යන ලදි. මෙම විසිර යන ලද නිලධාරීන් විශේෂ කාර්ය බලකායට අනුයුක්ත කර බස්නාහිර සහ දකුණ පළාත් වල සංවිධානාත්මක අපරාධ කල්ලි මැඩලීමේ රාජකාරි සඳහා යෙදවීමට නියමිතය.

සංවිධානාත්මක අපරාධ කණ්ඩායම් හා මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් යතුරුපැදි හා මෝටර් රථ මඟින් පැමිණ වෙඩි තැබීම් සහ වෙනත් අපරාධයක් සිදු කරන අවස්ථාවන් වලදී ඔවුන් පසුපස හඹා ගොස් අත්අඩංගුවට ගැනීම සඳහා විශේෂ පුහුණුවකින් යුතු මෙම කණ්ඩායම යතුරු පැදි 50කින් හා නිලධාරීන් 100 දෙනෙකුගෙන් සමන්විත වේ.

මෙම අවස්ථාව සඳහා විශේෂ කාර්ය බලකා අණදෙන නිලධාරී ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නීතිඥ වරුණ ජයසුන්දර මහතා, බස්නාහිර පළාත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති මහින්ද ගුණරත්න මහතා, පොලිස් මාධ්‍ය ප්‍රකාශක සහ අපරාධ දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති නීතිඥ නිහාල් තල්දුව මහතා සහ අපරාධ කොට්ඨාස භාර අධ්‍යක්ෂවරුන් ඇතුළු ශ්‍රී ලංකා පොලිසියේ නිලධාරීන් රැසක් සහභාගී විය.

මෙම අවස්ථාවට අදාල ඡායාරූප කිහිපයක්


Rapid Deployment Rider
Thursday, April 25,




NEWS
CENTER


WP BFD 4381




POLICE
BFO 9816







**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**